**වෝටර්ස් එජ් සමාගම - 2016**

**---------------------------------------------**

වෝටර්ස් එජ් සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදුකිරීම සඳහා මා විසින් පොදු පරිචයේ යෙදෙන වරලත් ගණකාධිකාරි සමාගමක සහාය ලබාගන්නා ලදි

.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත්කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම.

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදි අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමට අදහස් නොකරයි. මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රමිතිවල උචිතභාවය සහා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 2.1 මතය
---------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වෝටර්ස් එජ් සමාගම මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 අනිකුත් කරුණු
--------------------

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෝටර්ස් එජ් සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් පොදු පරිචයේ යෙදෙන වෙනත් වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් විගණනය කල අතර නාගරික සංවර්ධන අධිකාරිය (නා.ස.අ) විසින් පැවරූ රු.642,500,000 ක් වටිනා ස්ථාවර වත්කම් වලට අදාල තොරතුරු නොමැතිවීම, බෝඩ්වෝක් රෙස්ටුරන්ට් හි වටිනාකම රු.67,192,826 ක් ප්‍රාග්ධනගත කිරීම සහ කොටස් නිකුත් කිරීමේ එකඟතාව සඳහා වටිනාකම රු.842,500,000 ක් ආදිය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීම් අවශ්‍ය කරන්නා වූ හෙයින් 2016 ඔක්තෝබර් 10 වන දින මෙම මූල්‍ය ප්‍රකාශන මත විකරණය කරන ලද විගණන මතයක් ඉදිරිපත් කර තිබුණි.

### 2.1.2 අනෙකුත් නෛතික හා රෙගුලාසිවල අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම.
--------------------------------------------------------------------------------

2007 අංක 07 දරණ සමාගම් පනතේ 163(2) වගන්තියෙන් දක්වා ඇති පරිදි , මා පහත කරුණු දන්වමි.

(අ) විගණන මතය සඳහා පදනම සහ විගණන විෂය පථය හා සීමාවන් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මා දරන්නා වූ මතය

- විගණනය සඳහා අවශ්‍ය වූ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් මා ලබාගත් අතර මාගේ විගණන පරීක්ෂණවලින් පෙනීයන පරිදි සමාගම විසින් නියමිත ගිණුම් වාර්තා පවත්වා තිබුණු බව .

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ නියමයන්ට අනුකූල බව .

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

### 2.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට මාස 3 කට වඩා හිඟ හිටි ණයගැති ශේෂය රු.17,759,552ක් විය. මෙම හිඟහිටි ශේෂ සඳහා රු.7,007,754ක් නිශ්චිත ප්‍රතිපාදන කර තිබූ අතර ඉන් එකතුව රු.2,160,848 ක් වූ ප්‍රතිපාදන සඳහා එසේ නිශ්චිත ප්‍රතිපාදන වෙන්කිරීම සඳහා නිශ්චිත හේතු දක්වා නොතිබුණි.

(ආ) රු.1,124,668 ක දිගුකාලීන නොපියවූ බැරකම් නිරවුල් කිරීමකින් තොරව වෙනත් වගකීම් යටතේ ගිණුම්ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පාවෙන අවන්හල්වලට අදාල නොපියවූ ණය ශේෂයන් දින 120 ක් මුළුල්ලේ පැවතුණි.

**2.3 නිතිරිති , රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට අනුකුල නොවීම.**

---------------------------------------------------------------------

පහත සඳහන් අනුකුල නොවීමේ අවස්ථාවන් විගණනයේදි නිරීක්ෂණය විය.

| නිති,රිති,රෙගුලාසිවලට යොමුව | අනුකුල නොවීම |
|---|---|
| අ) 2016 දෙසැම්බර් 16 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සේවකයෙකුට ප්‍රසාද දීමනා වශයෙන් රු.15,000කට වඩා වැඩි මුදලක් ගෙවිය නොහැකි වුවද සමාලෝචිත වර්ෂයේදි සමාගම විසින් එක් එක් සේවකයෙකු සඳහා ප්‍රසාද දීමනා ලෙස රු.40,000 බැගින් ගෙවා තිබුණි. |
| ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අවම වශයෙන් මාස තුනකට එක්වරක් නිසිපරිදි විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. |

**3. මුල්‍ය සමාලෝචනය**

--------------------------

**3.1 මුල්‍ය ප්‍රතිඵල**

-----------------

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.මිලියන 289 ක බදු පෙර ලාභයක් වු අතර ඊට අනුරුපි ඉකුත් වර්ෂයේ බදුපෙර ලාභය වු රු.මිලියන 215 ක් සමඟ සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 74 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. විකුණුම් ආදායමේ රු.මිලියන 194 ක වර්ධනය සමාලෝචිත කාලපරිච්ඡේදයේ මුල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

මුල්‍ය ප්‍රතිඵල විග්‍රාහ කිරීමේදි, සේවක පාරිශ්‍රමික ආදායම් බදු සහ ක්ෂය සැලකිල්ලට ගැනීමේදි 2015 වර්ෂයේදි රු.මිලියන 502 ක් වු සමාගමේ දායකත්වය 2016 වර්ෂය වන විට රු.මිලියන 653 ක් දක්වා වර්ධනය වී තිබුණු බව නිරීක්ෂණය විය.

**3.2 විග්‍රාහාත්මක මුල්‍ය සමාලෝචනය**

--------------------------------------

**3.2.1 කැපිපෙනෙන ගිණුම්කරණ අනුපාත**

----------------------------------------

ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා වු සමාගමේ ඇතැම් වැදගත් අනුපාත ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | **2016** | **2015** |
|---|---|---|
| **දල ලාභ ආන්තිකය ( % )** | 62.87 | 61.81 |
| **ශුද්ධ ලාභ ආන්තිකය ( % )** | 20.28 | 19.15 |
| **ජංගම අනුපාතය (වාර ගණන)** | 1.62 | 1.66 |
| **ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර ගණන)** | 7 | 6 |
| **ණය එකතුකිරීමේ කාලය (දින ගණන)** | 52 | 60 |

ඉහත තොරතුරුවලට අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාගමේ ඉපැයීමෙහි සුළු වර්ධනයක් විය. කෙසේ වුවද ජංගම අනුපාතය සහ ණයගැති පිරිවැටුම් අනුපාතයෙහි සුළු පහලයෑමක් නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්ය සාධනය

-----------------

2016 වර්ෂය සඳහා සමාගම විසින් ගනුදෙනුකරුවන්ගේ දෘෂ්ඨිකෝණය, මූල්‍ය දෘෂ්ඨිකෝණය ක්‍රියාවලි දෘෂ්ඨිකෝණය සහ ජනතාවගේ දෘෂ්ඨිකෝණය මත පදනම්ව ප්‍රධාන කාර්යසාධන දර්ශක (ප්‍ර.කා.ද) පිලියෙල කර තිබුණි. කෙසේ වුවද 2016 වසරේදි සාක්ෂාත් කර ගත් සම්පූර්ණ කාර්යසාධනය සියයට 75 ක් පමණක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(i) බැන්කට් සහ ආපනශාලා වල ඉලක්කගත ආදායම් පහලයාම නිසා සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත මුළු ආදායම් රු.මිලියන 29 කින් ලඟාකර ගෙන නොතිබුණි.

(ii) 2016 වසර සඳහා ඉලක්කගත සේවක පිරිවැටුම සියයට 10 ක් වුවද සමාලෝචිත කාලපරිච්ඡේදය අවසානයේදි සත්‍ය සේවක පිරිවැටුම සියයට 12.5 ක් විය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) මික්ස් මෙගා ඩිවලොප්මන්ට් ව්‍යාපෘතිය වෙනුවෙන් 2014 සහ 2015 වර්ෂයන්හිදි සමාගම විසින් ශක්‍යතා අධ්‍යයන ගාස්තු, ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු සහ වෙනත් වියදම්ද ඇතුළුව රු.5,503,481 ක් ප්‍රාරම්භක පිරිවැය ලෙස දරා තිබුණි. කෙසේ වුවද, පයිලින් අදියර නිමකිරිමෙන් පසුව ව්‍යාපෘති කාර්යයන් අත්හැර දමා තිබුණි. වැඩ අත්හැරීම සඳහා වූ හේතූන් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ ඒකාබද්ධව පාවෙන අවන්හල් ක්‍රියාත්මක කිරීම තුලින් සමාලෝචිත වර්ෂය තුල සමාගම රු.5,454,251 ක ආදායමක් උත්පාදනය කර තිබුණද විධිමත් ගිවිසුමක් නාවික හමුදාව සමඟ අත්සන්කර නොතිබුණි.

### 4.3 මානව සම්පත් කලමනාකරණය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) අනුමත කාර්යමණ්ඩලය සමඟ සැසඳීමේදී සමාගමේ විවිධ තනතුරු වල සිටි අතිරික්ත සේවක සංඛ්‍යාව 101 ක් විය.

(ආ) සේවක වාර්තාවල වෙනස්කම් යාවත්කාලීන කිරීම සඳහා සමාගම සේවක පිරිවැටුම් වාර්තා කාලීනව නඩත්තු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරි සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන පරිදි සමාගම විසින් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.3 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේදි ඇස්තමේන්තු ගත සහ සත්‍ය ආදායම් සහ වියදම්හි සැලකිය යුතු විචලනයන් සියයට 26 සිට සියයට 211 දක්වා වු පරාසයක් තුල නිරීක්ෂණය වු අතර අයවැය ලේඛණය ඵලදායි කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර සමාගමේ සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) සමාගම විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නිවැරදිව හා කාලීනව නඩත්තු කර නොතිබුණි. |
| | | (ii) කර්මාන්තයේ නියමයන් වන වසර 40 ත් 50 ත් නොසලකා සමාගම විසින් හෝටල් ගොඩනැගිලි වසර 80 ක් මුළුල්ලේ ක්ෂයකර තිබුණි. |
| (ආ) | තොග පාලනය | (i) යල්පැන ගිය හා සෙමෙන් චලනය වන තොග හඳුනාගැනීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. |
| | | (ii) තොග සත්‍යාපනයේදි හඳුනාගත් වෙනස්කම් සඳහා සැසදීමක් කර නොතිබුණි. |
| (ඇ) | ගිණුම්කරණය | (i) සමාගම විසින් ජ'නල් සටහන් ඇතුලත් කිරීමේදි අනුක්‍රමික අංක පිලිවෙලක් අනුගමනය කර නොතිබුණි. |
| | | (ii) ජනල් සටහන් ඇතුලත් කිරීම සහ අනුමත කිරීම සඳහා මුල්‍ය අංශයේ කාර්යමණ්ඩලය අතර වැඩ බෙදීමක් කර නොතිබුණි. |
| | | (iii) සමාගම භාවිතකරන වත්කම් වල ඵලදායී ජීවිතකාලය වෙනස්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඈ) | පරිගණක පද්ධති පාලනය | ප්‍රමිත ක්‍රමවේදයට අනුකුල නොවීම නිසා පරිගණක මෙහෙයුම් පද්ධති මත භෞතික පාලනය පහල මට්ටමක පැවතුණි. |